**දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**
**--------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 23 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉඩම් ගොඩනැගිලි 67 ක පිරිවැය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර 2016 වර්ෂයේදි මිළදී ගත් ජල ටැංකිය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. | තක්සේරුකරුවෙකු ලවා ඉඩම් ගොඩනැගිලි තක්සේරු කරමින් පවතී. 2019 වර්ෂයේ ගිණුම්වලින් නිවැරදි කරමි. |
| (ii) | පුර නැගුම ව්‍යාපෘතිය යටතේ කාර්යාල හා සතිපොල ඉදිකිරීම් පිරිවැයට එකතු කල අගය මත බදු (vat) රු.4,256,317 ක් ගිණුම්ගත කිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් ගොඩනැගිලි පිරිවැය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | බදු මුදල් වත්කම් පිරිවැයෙන් ඉවත් කර ගිණුම් ගත කල යුතුයවේ. | 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී බදු මුදල් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | සෝභිතගම පුස්තකාලයේ තිබෙන පුස්තකාල පොත් තොගය රු.134,811 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අඩුවෙන් සටහන් වූ පුස්තකාල පොත් තොගය ප්‍රාග්ධනිත කල යුතුවේ. | 2019 වර්ෂයේදී අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |
| (iv) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගත් විදුලි ගබඩා හා පොදු ගබඩා තොග පිළිවෙලින් රු.124,028 ක් හා රු.18,500 ක් අදාළ තොග ගිණුම්වල හා සමුච්චිත අරමුදල් ගිණුමට හර කර තිබුණි. | සමුච්චිත අරමුදලට හර කිරිම නිවැරදි කල යුතුවේ. | 2019 වර්ෂයේදී නිවැරදි කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධනිත වත්කම් 08 ක් විකිණීමෙන් ලැබුණු රු.1,713,566 ක් වූ මුදල මිශ්‍ර ආදායම් තැන්පතු ගිණුමට බැර කර තිබුණි. තවද ඉහත වත්කම් 04 ක පිරිවැය වූ රු.2,843,550 ක් අදාල වත්කම් හා ප්‍රාග්ධනයට දායක වීමේ ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | වත්කම් විකිණීමේ ආදායම්, තැන්පතු ගිණුම්වලින් හා පිරිවැය වත්කම් ගිණුම් වලින් ඉවත් කල යුතුවේ. | 2019 වර්ෂයේදී අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |
| (vi) | 2018 වර්ෂයේ දේපල හා දැව වෙන්දේසියෙන් ලැබුණු රු.2,021,291 ක් වූ සියයට 1 ක බදු ආදායම මිශ්‍ර ආදායම් තැන්පතු ගිණුමට බැර කර තිබුණි. | වර්ෂයේ ආදායම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කල යුතුවේ. | 2019 වර්ෂයේදී අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (vii) | සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන ආධාර රු.7,586,848 ක් වැඩියෙන් හා ප්‍රාග්ධන වියදම රු.10,809,583 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ප්‍රාග්ධන ආදායම හා වියදම නිවැරදිව ගැලපිය යුතුවේ. | 2019 වර්ෂයේදී අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරමි. |
| (viii) | පළාත් පාලන ආයතනවල ගිණුම් තැබීමේ පරිපාටියට අනුව ස්ථාවර වත්කම් ගිණුම් ශේෂය හා ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීමේ ගිණුම් ශේෂය සමාන විය යුතු වුවත් , එම ගිණුම් දෙක අතර රු.3,028,092 ක වෙනසක් පැවතුණි. | වෙනස හඳුනාගෙන අදාල ගැලපීම් සිදු කල යුතුවේ. | දීර්ඝකාලීන පැවත එන වෙනස 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරමි. |
| (ix) | සමාලෝචිත වර්ෂයට අදාල වැටුප් ප්‍රතිපූර්ණ රු.2,999,425 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වැඩිපුර ලැබුණු වැටුප් ප්‍රතිපූර්ණය නිවැරදිව ගැලපිය යුතුවේ. | පිළිගනිමි. |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (x) | 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ලෙජරය අනුව සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.101,340 ක් වැඩියෙන් හා කර්මාන්ත ණයහිමි ගිණුමේ ශේෂය රු.241,918 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | 2019 වර්ෂයේදී අවසන් ගිණුම සකස් කිරිමේදි නිවැරදි කරමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූලා‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.305,858,758 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාළ ශේෂයන් ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.3,624,071 ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරිමට කටයුතු කල යුතුවේ. | 2019 වර්ෂයේදී අවසන් ගිණුම සකස් කිරිමේදි නිවැරදි කරමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) 2010 වර්ෂයේ සිට පැවත එන වීථි පහන් නඩත්තුව වෙනුවෙන් ලැබිය යුතු රු.1,545,121 ක මුදල අයකර ගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | විදුලි බල මණ්ඩලයේ ලිඛිත තහවුරුවක් මගින් 2019 වර්ෂයේ අවසන් ගිණුමින් නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (ii) වසර 21 සිට වසර 37 දක්වා කාලයක සිට පැවත එන රු.88,103 ක අත්තිකාරම් ශේෂයක් පියවිමට කටයුතු කර නොතිබුණි. | කල් ගතවු අත්තිකාරම් පියවීමට කටයුතු කල යුතුවේ. | 2019 අවසන් ගිනුම් සකස් කිරිමට පෙර නිවැරදි කිරිමට කටයුතු කරමි. |

(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 මූලා‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතු වටිනාකම රු.2,131,115 ක් වූ ට්‍රැක්ටර් දෙකක්,ට්‍රේලර්යක් සහ කසළ කරත්තයක් 2018 මූලා‍ය | අදාල සාක්ෂි ඉදිරිපත් කල යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර එම වත්කම් අපහරනය කල බවට හෝ වර්තමානයේ එම වත්කම් පවතින බවට හෝ කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.4 අනුකූල නොවීම
------------------
නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම
----------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය | | දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටියා වූ නිශ්චල දේපලවල වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. | වරිපනම් බදු සඳහා නව හඳුනා ගැනීම් සිදු කර අයකර ගැනිමට කටයුතු කල යුතුවේ. | වරිපනම් බදු ප්‍රතිශෝධන වසර 12 ක් ගතවී තිබුණු අතර දැනට ආදායම් පරික්ෂක වෙතින් තොරතුරු කැඳවීම් කර 2021 වර්ෂයේදී නව වරිපනම් කලාපයට අදාල වරිපනම් අයකිරිමට කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 131,364 | සෑම අර්ධ වර්ෂයක් අවසානයේදී ඉකුත් වූ සියළු තැන්පතු පිළිබඳ ලැයිස්තු පිළියෙල කර රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | මේ වන විට අවශ්‍ය කටයුතු කර අවසන් කර ඇති අතර ඉදිරියේදි නියමිත පරිදි කටයුතු කරමි. |
| (ඇ) | 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය | | පරිසර බලපත්‍ර නිකුත් කළ යුතු ආයතන 29 ක් සඳහා බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | ආයතන සඳහා පරිසර බලපත්‍ර නිකුත්කල යුතුවේ. | කාර්ය මණ්ඩලයේ ඌණතාවය නිසා පරිසර බලපත්‍ර නිකුත් කිරිම් ප්‍රමාද වී ඇත. ඉදිරියේදී එම කටයුතු යාවත්කාලින කරනු ලැබේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 වගන්තිය | 2,669,728 | ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කොන්ත්‍රාත් පිරිනැමීමේදී මූලික අවශ්‍යතා සපුරා නොගෙන කොන්ත්‍රාත් 05 ක් පිරිනමා තිබුණි. | ප්‍රජා පාදක සමිති වෙත කොන්ත්‍රාත් පිරිනැමීමේදී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය මත කොන්ත්‍රාත් පිරිනමා තිබූ අතර ඉදිරියේදි දන්වා ඇති පරිදි කටයුතු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.20,915,086 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,669,511 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 7,065,000 | 6,842,605 | 6,277,557 | 565,048 | 6,045,660 | 3,942,011 | 3,477,053 | 464,957 |
| (ii) | කුලී | 910,000 | 956,340 | 896,040 | 60,300 | 775,870 | 846,162 | 813,662 | 32,500 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 275,000 | 238,750 | 238,750 | - | 190,000 | 152,800 | 151,800 | 1,000 |
| (iv) | වෙනත් ආදායම් | 39,146,000 | 40,711,661 | 37,831,570 | 2,880,090 | 29,717,500 | 14,654,056 | 11,462,879 | 3,191,177 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් බදු හිඟය රු.2,106,206 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් | හිඟ වරිපනම් ආදායම කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ වරිපනම් අය කිරීමේ ප්‍රගතියක් පෙන්වන අතර ආදායම් කොට්ඨාශ 05 න් 03 ක පමණක් ආදායම් එකතු |

| | | | |
|---|---|---|---|
| | රු.1,235,275 ක් හෙවත් සියයට 59 ක ආදායමක් එකතු කර නොතිබුණි. | | කිරිමේ ගැටළුවක් පවතින අතර මෙම වසර අවසන් වීමට පෙර හිඟ මුදලින් උපරිමය අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ සමස්ථ වරිපනම් අය කිරිම රු.2,598,623 ක් වූ අතර එය සියයට 59 ක් විය. වර්ෂය අවසානය වන විට තව දුරටත් අයකල යුතු රු.1,794,324 ක වරිපනම් හිඟයක් පැවතුණි. | හිඟ වරිපනම් ආදායම කඩිනමින් අයකර ගත යුතු වේ. | වර්තමානයේ ප්‍රවර්තන ආදායම එකතු කිරිම සතුටුදායක අතර ගෙවීම් පැහැර හැරීම නිසා ප්‍රවර්තන වර්ෂයේ සියයට 24.5 ක් අයකර ගැනීමට නොහැකි විය. |
| (iii) | 2018 දෙසැම්බර් 31 දිනට වූ වරිපනම් බදු හිඟය තුල වර්ෂ 01 - 03 අතර ඒකක 1184 ක් වෙනුවෙන් හිඟ රු.568,168 ක්ද , වර්ෂ 04-10 ත් අතර ඒකක 264 ක් වෙනුවෙන් හිඟ රු.386,740 ක්ද, වර්ෂ 10 ට වැඩි ඒකක 526 ක් වෙනුවෙන් හිඟ රු.808,072 ක් ද විය. | කාලයක සිට පවතින හිඟ මුදල් අය කිරිමට කටයුතු කල යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනිමට ආදායම් පරීක්ෂකවරුන්ට ඉලක්ක ලබා දී ඇත. |

(ආ) උසාවි දඩ හා මුද්දර ගාස්තු
------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) උසාවි දඩ | | |
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ මුදල රු.20,879,490 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර ඉන් රු.17,535,530 ක වර්ෂ 03 කට පෙර සිට පැවති ශේෂයක් විය. | හඳුනාගෙන අවශ්‍ය කටයුතු සිදු කල යුතුවේ. | මේ වන විට සාවද්‍ය බිල් කිරිම නතර කර ඇත. |
| (ii) මුද්දර ගාස්තු | | |
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තුව රු.5,596,585 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර වර්ෂයේ බිල් කිරිම රු.27,000,000 ක් විය. බිල් කරන ලද මුද්දර ගාස්තුවලින් කිසිදු මුදලක් | බිල් කරන ලද මුද්දර ගාස්තු ලබා ගැනීමට කටයුතු කල යුතුවේ. | උපලේඛන ලබාගැනිමේ ප්‍රමාදයන් නිසා අයකිරිම් ප්‍රමාද වූ අතර මේ වන විට උපලේඛන ලබා ගැනිමට කටයුතු කරමි. |

වර්ෂය තුළ ලැබී නොතිබුණු බැවින් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු මුදල අවම වශයෙන් රු.27,000,000 ක් විය යුතුව තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කාර්ය සාධනය
------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ක්‍රියාකාරි සැලැස්ම | | |
| සභාව විසින් 2018 වර්ෂය වෙනුවෙන් පිළියෙළ කළ අයවැය ලේඛනයෙන් රු.මි.88.48 ක් වෙන් කළද වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට රු.මි.70.64 ක ප්‍රතිපාදනයන් පමණක් ඇතුළත් කර තිබුණි. | අයවැය ලේඛනය පදනම් කර ගෙන ක්‍රියාකාරි සැලැස්ම සකස් කල යුතුවේ. | පිලිතුරු ලබා දී නොතිබුණි. |
| (ආ) අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම් | | |
| (i) වාර්ෂික අයවැය ලේඛනය මගින් මාර්ග හා පාලම් යටතේ රු.මි.4.9 ක ප්‍රාග්ධන වියදම් වෙන් කර එයින් රු.මි. 2.1 ක ව්‍යාපෘති 04 පමණක් ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කලද එම ව්‍යාපෘති ද ක්‍රියාත්මක කර නොතිබුණි. | අයවැය ලේඛන ප්‍රතිපාදන ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතුවේ. | ක්‍රියාකාරි සැලැස්ම අනුව අයවැය ලේඛනය පිළියෙල කිරිමට කටයුතු කරමි. |
| (ii) ක්‍රියාකාරි සැලැස්මේ අපේක්ෂිත නිමවුම හා ප්‍රතිඵල අනුව කාර්ය සාධනය ඇගයිම් කල යුතු වුවද , රු.මි. 88.5 ක අයවැය ඇස්තමේන්තු පදනම් කර ගෙන ක්‍රියාකාරි සැලැස්ම තුල ක්‍රියාකාරකම් හඳුනාගෙන තිබුණ ද , එම ක්‍රියාකාරකම් වල කාර්ය සාධනය මිණුම් කිරිමේ ක්‍රම වේදයක් සභාව සතුව නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මේ කාර්යය සාධනය ඇගයිම් කිරිමේ ක්‍රමවේදයක් තිබිය යුතුවේ. | ඉදිරියේදි නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය කිරිමට කටයුතු කරමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| | | |
|---|---|---|
| ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2017 ජුලි 31 දිනැති අංක BD/CBP/4/1/2-2018 දරන චක්‍රලේඛය අනුව අයවැය ඇස්තමේන්තුව සකස් කිරිමේදි එම චක්‍රලේඛයේ හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති උපාය මාර්ග පිළිබඳව සභාව දැනුවත්ව නොතිබුණු අතර තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශව නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. තවද තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟාවිම සඳහා සභාව විසින් 2018 වර්ෂය තුල වාර්ෂික අයවැය ලේඛනයේ ප්‍රතිපාදන සලසා නොතිබු අතර ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර ක්‍රියාත්මක කල බවට සාක්ෂි නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක අරමුණු හඳුනාගෙන අයවැය ලේඛනගත කර ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර ක්‍රියාත්මක කල යුතුවේ. | 2018 වර්ෂයේදි කාර්ය මණ්ඩලය දැනුවත් වි නොතිබුණු අතර 2019 වර්ෂයේදි කටයුතු කරමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට තාක්ෂණ නිලධාරි, වැඩ ක්ෂේත්‍ර පරිපාලක, බර යන්ත්‍ර ක්‍රියාකරු, මුරකරු හා සෞඛ්‍ය කම්කරු යන තනතුරුවල පැවති පුරප්පාඩු පිරවීමට සභාව කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කල යුතුවේ. | තාක්ෂණ නිලධාරි බඳවාගැනීම සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත තෛමාසිකව වාර්තා කරයි. වැඩ / ක්ෂේත්‍ර පරිපාලක තනතුරු පුරප්පාඩු පිරවීමට ප්‍රධාන ලේකම් ගෙන් ඉල්ලීම් කර ඇත.බර වාහන ක්‍රියාකරු සඳහා අයදුම්පත් කැඳවුවද ඒ සඳහා ඉදිරිපත් නොවු අතර මුරකරු හා සෞඛ්‍ය කම්කරු තනතුරු 02 ක සඳහා පත්වීම් ලබා දී ඇත. |
| (ආ) සේවය හැරගිය නිලධාරින් දෙදෙනෙකුගේ මාස 06 සිට වසර 07 ක කාල සීමාවන් තුල පැවති රු.106,505 ක ණය ශේෂය ගැනිමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගත යුතුවේ. | ණය ලබාගත් නිලධාරින් දෙදෙනා වසර 10 ට අඩු සේවා කාලයක් ඇති නිලධාරින් දෙදෙනෙකු වුවද ඇප තැන්පතු ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි. මේ සඳහා නිතිමය කටයුතු කිරිමට පියවර ගෙන ඇත. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉඩම් කට්ටි කර විකිණීමේදී එසේ වෙන්දේසි කරන ඉඩම්වල විකුණුම් වටිනාකම මත සියයට එකක බදු මුදලක් අයකල යුතු වුවත් රු.2,838,782 ක බදු මුදල් සභාවේ ආදායම් පරික්ෂකගේ තක්සේරු වාර්තාව පදනම් කර ගෙන අයකර තිබුණි. | බදු මුදල් අයකර ගැනිමේදි ඉඩම්වල විකුණුම් වටිනාකම මත අයකල යුතුවේ. | වෙන්දේසි සමාගම් බිම් කොටස්වල වටිනාකම් ලබාදෙනු ලැබුවද එම වටිනාකම් මත කටයුතු නොකර ආදායම් පරික්ෂක විසින් ප්‍රදේශයේ ඉඩම්වල තක්සේරුවක් ලබාගෙන ඒ අනුව කටයුතු කර ඇත. |
| (ආ) | ඉඩම් වෙන්දේසියක් මගින් 2000 වර්ෂයේ පොදු කටයුතු සඳහා ලැබී තිබූ රූඩ් 03 පර්චස් 14 ක ඉඩමෙන් කොටසක අනවසර ස්ථිර නිවාස 02 ක් ඉදිකර පදිංචි වී තිබුණි. | අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගත යුතුවේ. | වසර ගණනාවක සිට පදිංචිව ඇති බැවින් ස්ථානීය පරික්ෂණයක් සිදු කර ඉදිරියේදී ඒ සම්බන්ධව කටයුතු කරමි. |

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 නිශ්ක්‍රිය හා ඌන උපයෝගිතා වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දොඩන්ගොඩ පොදු වෙළඳපොලෙහි කඩ කාමර 17 ක් ව්‍යාපාරික කටයුතු සඳහා බදු දී තිබුණද ව්‍යාපාරික කටයුතු වලට යොදා නොගෙන නිශ්කාර්යව වසා තිබුණි. | නිශ්ක්‍රිය වත්කම් උපයෝජනයට කටයුතු කල යුතුවේ. | මෙම ගොඩනැගිල්ල වසර 30 කට පැරණි බැවින් එහි ව්‍යාපාරික කටයුතු සිදු කිරිම නොහැකි වී ඇති අතර නව ගොඩනැගිලි සංකීර්ණයේ ඉදි කිරීම් කටයුතු ආරම්භ කර ඇත. |

3.5.2 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ අපහරණය කරන ලද වාහන 02 ක් හා අත්ගල් රෝලක් සඳහා තක්සේරු වටිනාකමක් ලබාදී තිබුණ ද, එම තක්සේරු අගයට වඩා අඩු වටිනාකමකට විකිණීමෙන් සභාවට රු.120,750 ක පාඩුවක් සිදු වී තිබුණි. | වත්කම් තක්සේරු වටිනාකමට වඩා අඩුවෙන් නොවිකිණිය යුතුවේ. | අබලන් වී ඇති වාහන කොටස් සඳහා පුවත්පත් දැන්වීම් පලකල නමුත් තක්සේරු මිලට වඩා අඩුවෙන් ලංසු මුදල් ලැබීම නිසා නැවත මිල ගණන් කැඳවීමට කාලය හා වියදම් දැරීමට සිදු වන බැවින් උපරිම ලංසුව පිලිගෙන ඇත. |

3.6 හඳුනාගත් පාඩු

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තොග ලෙජරයේ ශේෂය හා ගබඩා නිලධාරිනිය සතුව පැවති භෞතික තොග ශේෂයන් අතර පැවති ඌනතාවය නිසා රු.280,998 ක් විය. | තොග ලේඛන යාවත්කාලින කල යුතුය. | නියමිත පරිදි තොග ලේඛන යාවත්කාලින නොවීම හැර ඌනතාවයක් නොමැති බව පෙන්වා දෙමි. ගබඩා ලේඛන මේ වන විට යාවත්කාලිනව පවත්වාගෙන යනු ලැබේ. |

3.7 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කොන්ක්‍රිට් මාර්ගයන්හි සණකම හා සම්පිණ්ඩන ශක්තිය පරික්ෂාවකින් තොරව කරුණාරත්න මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කර රු.380,864 ක් කොන්ත්‍රාත් සමිති වෙත ගෙවා තිබුණි. | කොන්ක්‍රිට් මාර්ගවල සම්පීඩන ශක්තිය පරීක්ෂා කළ යුතුවේ. | පිලිතුරු ලබා දී නොමැත. |

4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

--------------------------------------

නොවිසඳී ඇති විගණන නිරීක්‍ෂණ

--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 සැප්තැම්බර් 13 දින පැවති පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් 2011 විගණකාධිපති වාර්තාවේ 2.4(අ) ,(ඊ) හා 2012 විගණකාධිපති වාර්තාවේ 2.1.1 (අ) ඡේද සම්බන්ධයෙන් දි තිබු නියෝග 2019 මැයි 27 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | ගිණුම් කාරක සභාවේ නියෝග ක්‍රියාත්මක කළ යුතුවේ. | 2011 වර්ෂයේ 2.4 (අ) ඡේදය වසර 30 කට වැඩි කාලයක සිට පැවත එන අත්තිකාරම් වේ.ලිපි ගොනු සොයාගත නොහැකි වු අතර හැකි ඉක්මනින් නිරවුල් කිරීමට කටයුතු කරමි.<br>2.4 (ඊ) ඡේද හිටපු සභාපති දැනුවත් කර ඇති අතර සහකාර පළාත් කොමසාරිස්ගේ උපදෙස් මත ඉදිරි කටයුතු කරමි.<br>2012.2.1.1 සම්බන්ධව කටයුතු කරමින් පවති. |